පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.22 පැය 1910 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1929/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**සංවිධානාත්මක අපරාධකරුවෙකුට අයත් රුපියල් ලක්ෂ 500 ක් වටිනා නීති විරෝධී ආකාරයෙන් උපයා ගන්නා ලද දේපළ ක්‍රියා විරහිත කිරීම සම්බන්ධව - නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

සංවිධානාත්මක අපරාධකරුවෙකු වන මන්දිනු පත්මසිරි පෙරේරා නොහොත් “කෙහෙල්බද්දර පත්මේ” යන අය විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් හා වෙනත් අපරාධ සිදු කර උපයාගන්නා ලද පහත සඳහන් දේපළ මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව **2025.10.22 වන දින සිට දින 07 ක කාලයක් ක්‍රියා** විරහිත කිරීමට ගරු අධිකරණය මඟින් නියෝග කර ඇති අතර ඒ සම්බන්ධ විමර්ශන සිදු කර වාර්තා කරන ලෙසටත් නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වෙත නියෝග කර ඇත.

**ඒ අනුව උඩුගම්පල ප්‍රදේශයේ පිහිටි කාමර 06 ක් සහිත අඩක් නිම කර ඇති රුපියල් ලක්ෂ 200 ක වටිනාකමකින් යුත් හෝටල් ගොඩනැගිල්ලක් හා ඊට යාබදව පිහිටි පර්චස් 20 ක රුපියල් ලක්ෂ 300 ක් පමණ වටිනා ඉඩම මෙලෙස ක්‍රියා විරහිත කර ඇත.**

එම දේපළ ක්‍රියා විරහිත කල දින 07 ක කාලය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව දීර්ඝ කිරීම සඳහා ගරු මහාධිකරණය වෙත කරුණු වාර්තා කිරීමට නියමිතව ඇති අතර මේ සම්බන්ධව නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් ඉදිරි විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**